රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2021.05.21**

**නිවේදන අංකය: 490 /2021**
**නිකුත් කළ වේලාව:07:30**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ**
**අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු**

**ඊයේ (20) කොවිඩ් මරණ 38 යි**

2021 මැයි 07 දින සිට මැයි 20 දක්වා සිදුව ඇති කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ 38 ක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඊයේ (20) තහවුරු කරන ලදී. ඒ සමග ශ්‍රී ලංකාවෙන් වාර්තා වන කොවිඩ් - 19 ආසාදිත රෝගීන්ගේ සමස්ථ මරණ සංඛ්‍යාව 1089 කි.

මියගිය අය උඩුකිඳ, ලුණුගල, බලංගොඩ, කටුනායක, බාදුරුගොඩ, කොච්චිකඩේ, මීගමුව, තලාතුඔය, බණ්ඩාරකොස්වත්ත, බොරුල්ල, පාදෙණිය, තෝරයාය, පොල්ගහවෙල, ගල්ගමුව, සියඹලාපෙ, මතුගම, එතැනවත්ත, නාවලපිටිය, කුරුණෑගල, යටියන්තොට, පොල්ගහවෙල, බෙලිහුල්ඔය, නෑබඩ, කැකුණුගොල්ල, නිකවැරටිය, වරකාපොල, අම්පිටිය, මාරස්සන, රජවෙල්ල, උඩිස්පත්තුව හා හබරාදුව යන ප්‍රදේශවල පදිංචිකරුවෝ වෙති.

ඔවුන්ගෙන් 24 දෙනෙක් වයස අවුරුදු 71 ඉක්මවූවෝ වෙති. වයස අවුරුදු 61 සහ 70 අතර පුද්ගලයන් 10 දෙනකුද, වයස අවුරුදු 51 - 60 අතර පුද්ගලයකුද, වයස අවුරුදු 41-50 අතර පුද්ගලයෙකුද, වයස අවුරුදු 31-40 අතර පුද්ගලයන් දෙදෙනෙක්ද වෙති.

මොවුන්ගේ මරණ වලට මූලික හේතු වී ඇත්තේ කොවිඩ් නියුමෝනියාව, දියවැඩියාව, හෘද රෝග ඇතුලු නිදන්ගත රෝග ආශ්‍රිත සංකූලතා බව සඳහන් වෙයි. මියගිය පිරිසෙන් 19 දෙනකු කාන්තාවන් වන අතර ඉතිරි සියලු දෙනා පිරිමි වෙති.

**මොහාන් සමරනායක**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**

163, කිරුලපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை வாவி, கொழும்பு 05, இலங்கை.
දු. தொ. T (+94 11) 2515759
ෆැ. பெ. F (+94 11) 2514753
www.news.lk